රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි :- 02/2016

මගේ අංකය : EST-6/LEAVE/03/3134
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ
අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2016.05.16

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා අත් කර ගැනීමේ පරීක්ෂණ සඳහා පෙනී සිටීම වෙනුවෙන් රාජ්‍ය නිලධරයන්ට පවතින රාජකාරී නිවාඩු හිමිකම</u>**

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් නිකුත් කළ 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව 2007.07.01 දිනෙන් පසු විවෘත හෝ සීමිත හෝ කුසලතා හෝ පදනම් මත රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධරයන් රාජ්‍ය සේවයට බැඳී වසර 05ක් ඇතුළත තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ තම තනතුරට අදාළව නියම කර ඇති භාෂා ප්‍රවීණතා මට්ටම අනුව ප්‍රවීණතාව අත් කර ගත යුතු ය.

02. රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස මෙසේ අත් කර ගැනීමට නියම කර ඇති භාෂා ප්‍රවීණතාව වෙනුවෙන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව හෝ විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන පරීක්ෂණ සඳහා ඉදිරිපත් වන රාජ්‍ය නිලධරයන්ට ඇතැම් රාජ්‍ය ආයතන විසින් රාජකාරී නිවාඩු අනුමත නොකරන බව වාර්තා වී ඇත.

03. එබැවින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා 01/2014 අනුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව අත් කර ගැනීම සඳහා පවත්වනු ලබන පරීක්ෂණ සඳහා පළමු වතාවට පෙනී සිටීම වෙනුවෙන් පමණක් ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 19 වගන්තියෙහි විධිවිධාන අනුව රාජ්‍ය නිලධරයන්ට රාජකාරී නිවාඩු අනුමතිය ලබා දිය යුතු ය.

ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය